# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2488/15 – 2026 මැයි මස 13 වැනි බදාදා – 2026.05.13**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**ඇඳුම් සැදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වන අධිකාරය) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තිය යටතේ ඇඳුම් සැදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව, මෙහි උපලේඛනයේ නිශ්චිතව සඳහන් කරන තීරණ කම්කරු ඇමතිවරයා විසින් අනුමත කරන ලද බව එකී ආඥාපනතේ 29 (3) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම තීරණය 2026 ජනවාරි මස 01 දින සිට වලංගු විය යුතු ය.

**එස්.එම්. පියතිස්ස,**
ලේකම්,
කම්කරු අමාත්‍යාංශය.

2026 මැයි මස 07 වැනි දින,
“ මෙහෙවර පියෙස”,
කොළඹ 05.

*උපලේඛනය*

ඇඳුම් සැදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව 1966 මාර්තු මස 25 වැනි දින අංක 14688 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනයේ උපලේඛනයේ සවිස්තරව දක්වා ඇත්තා වූ ද, කලින් කල වෙනස් කරන ලද්දා වූ ද, අවසන් වරට 2018 ජූලි මස 26 වැනි දින අංක 2081/48 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ කරන ලද නිවේදනය මගින් එකී උපලේඛනයෙහි II වැනි කොටස වෙනුවට පහත සඳහන් අලුත් කොටස ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් කළ යුතු ය.

*II වන කොටස*

**මසකට ගෙවිය යුතු වේතන ප්‍රමාණය**

**කම්කරුවන්ගේ පන්තිය**

(1) (අ) වැනි ශ්‍රේණිය : මෝස්තරකරුවෝ හෝ ඩිසයිනර්වරු, ඇඳුම් මහන්නෝ, ඩිසයින් පත්‍ව් කරන්නෝ, ඩිස්කට් සකසන්නෝ

(I) (ආ) වැනි ශ්‍රේණිය : ප්‍රධානීන් *නොහොත්* අංශ පරිපාලකවරු

II වැනි ශ්‍රේණිය : ඇඳුම් කපන්නෝ (අතින්), ඇඳුම් කපන්නෝ, යන්ත්‍ර අලුත්වැඩියා කරන්නෝ, අවසාන වරට හරි වැරදි බලන්නෝ,

III වැනි ශ්‍රේණිය : හරි වැරදි බලන්නෝ සහ තෝරන්නෝ, රෙදි මදින කම්කරුවෝ (පිරිමි), විවිධ වැඩ කරන (ගැහැණු) කම්කරුවෝ, මුද්‍රා තබන (ගැහැණු) කම්කරුවෝ, රෙදි මදින්නෝ (ගැහැණු), මහන යන්ත්‍ර ක්‍රියාකරවන්නෝ, විදුලි බලයෙන් රෙදිමදින යන්ත්‍ර ක්‍රියාකරවන්නෝ, නිකුත් කරන ( ගැහැණු) කම්කරුවෝ, මැෂින්/අතින් එම්බ්‍රොයිඩර් කරන්නෝ.

IV වැනි ශ්‍රේණිය : රෙදි අතුරන්නෝ (පිරිමි), රෙදි අතුරන්නෝ (ගැහැණු), අහුරන්නෝ, සෙලෝෆේන් හා කාඩ්බෝඩ් පෙට්ටි සාදන්නෝ, නුපුහුණු කම්කරුවෝ, ගබඩා කම්කරුවෝ.

V වැනි ශ්‍රේණිය : ආධුනිකයන් හා පුහුණුවන්නන්,

ඉහත සඳහන් යම් වෘත්තීය ආධුනිකයෙකුගේ හෝ පුහුණුවන්නෙකුගේ ආධුනික කාලය වැඩ කරන දින 156කින් යුක්ත විය යුතුය.

**මසකට ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණය**

| *සේවා වර්ෂය* | *I (අ) ශ්‍රේණිය රු. ශත* | *I (ආ) ශ්‍රේණිය රු. ශත* | *IIශ්‍රේණිය රු. ශත* | *IIIශ්‍රේණිය රු. ශත* | *IV ශ්‍රේණිය රු. ශත* | *V ශ්‍රේණිය රු. ශත* |
|---|---|---|---|---|---|---|
| 1 සේවා වර්ෂය | 32,650.00 | 32,100.00 | 30,700.00 | 30,600.00 | 30,000.00 | 20,000.00 |
| 2 සේවා වර්ෂය | 32,850.00 | 32,275.00 | 30,850.00 | 30,725.00 | 30,100.00 | |
| 3 සේවා ර්වෂය | 33,050.00 | 32,450.00 | 31,000.00 | 30,850.00 | 30,200.00 | |
| 4 සේවා ර්වෂය | 33,250.00 | 32,625.00 | 31,150.00 | 30,975.00 | 30,300.00 | |
| 5 සේවා ර්වෂය | 33,450.00 | 32,800.00 | 31,300.00 | 31,100.00 | 30,400.00 | |

EOG 05-0052

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.